සැලසීනෙ
செலசீனெ
SELACINE

SELACINE TELEVISION INSTITUTE







වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT 2022

ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministy of Mass Media

සැලසිනෙ රූපවාහිනී
SELACINE
SELACINE TELEVISION INSTITUTE

2022

වාර්ෂික වාර්තාව

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා
ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05.

ගරු අමාත්‍යතුමනි,

වාර්ෂික වාර්තාව - 2022

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.



හරිත් ගුණවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 07

පෙළ ගැස්ම

දැක්ම, මෙහෙවර, අරමුණු	05
සභාපතිතුමාගේ සමාලෝචනය	07
සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය	09
ආයතනික තොරතුරු	10
පරිපාලන ව්‍යුහය 2022 හා සම්බන්ධ තොරතුරු	11
මූල්‍ය වාර්තා - 2022	15
ශේෂ පත්‍රය	18
ආදායම් ප්‍රකාශය	19
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	20
මූල්‍ය වාර්තා සඳහා සටහන්	21
2022 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය	30

දැක්ම, මෙහෙවර සහ අරමුණු

මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනඟි සේවාවක් සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම.

අරමුණ

මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.

වෙළෙඳපොල ලාභය ඉහළ දැමීම.

සේවාලාභී සංස්කෘතිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.

ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.



සභාපතිතුමාගේ සමාලෝචනය

මා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සභාපති ධුරයට පත්වීමෙන් පසුව ආරම්භ වූ පළමු වර්ෂය වන 2022 වර්ෂයට අදාල මෙම වාර්ෂික වාර්තාව වෙනුවෙන් මෙලෙස පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටකි.

1982 වර්ෂයේ දී ආරම්භ වූ මෙම ආයතනය පසුගිය වසර 40 ක කාලය තුල විවිධ හැල හැප්පීම් මැද පැමිණිය ද 2022 වර්ෂය දේශපාලනික කුණාටු, අරගල ආදිය, දැඩි ඉන්ධන අර්බුදය, ඩොලරයේ අගය රුපියලට සාපේක්ෂව අධික ලෙස ඉහළ යාම, නිෂ්පාදන අමුද්‍රව්‍ය හා සේවා මිල ඉහළයාම වැනි අර්බුද නිසා සැලසිනෙ ආයතනයේ ක්‍රියාකාරකම් සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට අපහසු මට්ටමක පැවතුනි.

මෙම තත්ත්වය මත රාජ්‍ය ආයතනවල ප්‍රචාරණ කටයුතු සඳහා වූ ප්‍රතිපාදන කපා හැරීම නිසා ස්වයං මූල්‍ය උත්පාදන ආයතනයක් වූ අප ආයතනයේ 2022 වර්ෂයේ අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ අතර, කාර්යය මණ්ඩල වැටුප් ඇතුලු පරිපාලන වියදම්, නිෂ්පාදන වියදම් ද ඉහල යාම නිසා 2022 වර්ෂයට අපේක්ෂිත ලාභ උපයා ගැනීමට නොහැකි වී ඇත.

එවැනි තත්ත්වයක් තිබිය දී ඇති විය හැකිව තිබූ අලාභයක් අවම කිරීම සඳහා පරිපාලන හා අනෙකුත් වියදම් හැකි උපරිම මට්ටම දක්වා අවම කරමින් පාලනය කර ගැනීමට හැකි වූ බවද කිව යුතුය.

2022 වර්ෂය තුල සැලසිනෙ ආයතනය නීතීගත කිරීමේ කටයුතු අවසන් අදියර දක්වා ගෙන ඒමට හැකිවීම ගැන සතුටු වෙමි.



හරිත් ගුණවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය



සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය

1982.02.02 දින පූර්ණ වශයෙන් රජයට අයත් ආයතනයක් ලෙස ආරම්භ කර ඇති සැලසිනෙ රූපවාහිනී ආයතනය අංකඃ 1380/15 දරණ 2005.02.16 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව රජයට අයත් එකම වෙළඳ දැන්වීම් ආයතනය බවට පත් කර ඇත.

වසර 40කට ආසන්න කාලයක් විවිධ හැල හැප්පීම් අනුව ගැටෙමින් පැවත ආ සැලසිනෙ ආයතනය කොවිඩ් 19 ව්‍යාප්තිය හමුවේ දීර්ඝ කාලයත් රට වසා දැමීම නිසාත්, 2022 වර්ෂයේ විවිධ දේශපාලනික හැල හැප්පීම් නිසාත්, විදේශ විනිමය හිඟකම නිසා සිදු වූ ආර්ථික කඩා වැටීම නිසාත්, රාජ්‍ය ආයතනවල වියදම් ඉතා අධික ලෙස සීමා කිරීම යටතේ ප්‍රචාරණ වියදම් සීමා කිරීම නිසාත් වාර්ෂිකව බලාපොරොත්තු වූ ආදායම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇත. නමුත් පරිපාලන හා අනෙකුත් වියදම් හැකි උපරිම මට්ටමින් සීමා පනවමින් අවම තත්ත්වයක පවත්වාගෙන ගියද ආයතනය ඉහත තත්ත්වයන් යටතේ පාඩු ලබමින් සිටින බව කිව යුතුය.

කෙසේ වුවද එම පාඩුව අවම කර ගනිමින් පාඩු නොලබන මට්ටමක රඳවා ගැනීමට හැකි උපරිමය කරමින් පවතී.

කෙසේ වෙතත් අර්බුදකාරී වාතාවරණයක් වුවද 2022 දෙවන කාර්තුවේ සිට සැලසිනෙ රූපවාහිනී ආයතනයේ කාර්යය මණ්ඩලයට එකතු වීමට ලැබීම සතුටුවෙමි.



ඩබ්.විල්.ඒ.කේ.ඒ. ගුණතිලක
සාමාන්‍යාධිකාරී
සැලසිනෙ රූපවාහිනී ආයතනය

ආයතනික තොරතුරු

නාමය

සැලසිනෙ රූපවාහිනී ආයතනය

නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982 සිට 1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම.
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවේදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001.12.20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2004.04.28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

ආයතනික කාර්ය භාරය

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුළත් කෙරුණි.
    - i. මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
    - ii. රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
    - iii. රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008.12.02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008.12.24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු.

පරිපාලන ව්‍යුහය - 2022

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

හරිත් ගුණවර්ධන	- සභාපති
ඩබ්ලිව්. එල්. ඒ. කේ. ඒ. ගුණතිලක	- සාමාන්‍යාධිකාරී

කළමනාකරණය

කානේෂි දහනායක	- කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන - වැ.බ)
සුනන්ද වීරසිංහ	- කළමනාකරු (ශ්‍රව්‍ය/දෘෂ්‍ය) නිෂ්පාදන
මලීන් දනුෂ්ක	- පාරිභෝගික සේවා අධ්‍යක්ෂක
නලින් අලහකෝන්	- කළමනාකරු (මාධ්‍ය)
නදීකා ගමනායක	- කළමනාකරු (මූල්‍ය)
සුපිත් පුෂ්පකුමාර	- කළමනාකරු (ග්‍රැෆික්)
ප්‍රභාත් කහදුවආරච්චි	- කළමනාකරු (මිලදී ගැනීම් හා සැපයුම්)

විගණක

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන්

ලංකා බැංකුව

මහජන බැංකුව

සම්බන්ධීකරණ තොරතුරු

ලිපිනය	- අංක. 380/57, සරණ පාර, කොළඹ 07
දුරකථන	- 011-4320777, 011-4061586
ෆැක්ස්	- 011-2058229
විද්‍යුත් තැපෑල	- selacine@gmail.com
වෙබ් අඩවිය	- www.selacine.lk

නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

තරඟකාරී වෙළඳපොළ ජයගැනීම සඳහා වර්තමානයට හා අනාගතයට ගැළපෙන ලෙස ගුණාත්මකව නිර්මාණ ඉදිරිපත් කිරීම තුළින් ආයතනයේ ඉදිරිය උදෙසා කටයුතු කිරීම අප අංශයේ වගකීමකි. මේ වන විට එය ජයග්‍රාහණය කරා යොමුකරමින් කණ්ඩායමක් ලෙස කැපවීමෙන් කටයුතු කරමින් සිටී.

නිර්මාණ හා ග්‍රැෆික් අංශයේ අප කණ්ඩායම උපරිම දායකත්වය හා කැපවීමෙන් ප්‍රචාරක දැන්වීම්, පුවත්පත් දැන්වීම්, බිල්ඩ් බෝඩ්, අත්පත්‍රිකා ඇතුළු සියලුම මුද්‍රණ කටයුතු, බාහිර ප්‍රචාරක කටයුතු ඇතුළු නිර්මාණ කාර්යයන් නව තාක්ෂණික දැනුම උපයෝගී කර ගනිමින් කලට වේලාවට නිම කර දීමට ඇප කැප වී සිටින්නෙමු.

අප අංශයේ කාර්ය භාරය කාර්යාල වේලාවන් තුළ පමණක් සිදු නොවන අතර, ඉන් පරිබාහිරවද ක්‍රියාත්මක වනු ඇත. පසුගිය කොවිඩ් වසංගත කාලය තුළ අප සහෝදර කැළ උපරිම ශක්තිය යොදවමින් සියලුම අංශයන්හි සම්බන්ධීකරණයෙන් ආයතනයට ලැබුණු මුද්‍රිත හා සමාජ මාධ්‍ය හරහා සිදුකළ යුතුව තිබූ සියලුම කාර්යයන් නොපිරිහෙලා ඉටුකරන ලදී. එසේ කිරීම හේතුවෙන් ආයතනයේ දියුණුව කරා ගමන්කළ යුතුව තිබූ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට සාමූහිකව ක්‍රියා කිරීමට හැකිවිය.

අක්‍රීයව තිබූ හා පාඩු ලබමින් තිබූ අධිවේගී මුද්‍රණ අංශය අප ග්‍රැෆික් අංශයට අනුයුක්ත කිරීමෙන් පසු කාර්යක්ෂමතාව හා ලාභ ලබන තත්වයකට පත් කර, නව සේවාදායකයින් වැඩිකර ගැනීමට අප හට හැකි විය.

අප අංශයේ 3D නිර්මාණකරණ දක්ෂයන් ද සිටි නිසාවෙන් අපගේ සේවාදායකයින්ගේ අවශ්‍යතාවයට සරිලන පරිදි ආදර්ශ ඉදිරිපත් කිරීම නිසා ඔවුන් ඉන් තෘප්තිමත්භාවයට පත්ව නිර්මාණ කටයුතු සියල්ල පාහේ අප ආයතනය හරහා සිදුකරවා ගැනීමට යොමුවූ බව ඉතා සතුටින් දන්වනු කැමැත්තෙමි.

වාර්ෂික ආදයම් ඉලක්කය සපුරාගැනීම සඳහා අවශ්‍ය උපරිම දායකත්වය සපයමින් නව පරිපාලනයක් සමඟ අත්වැල බැඳගනිමින්, කාර්ය සාධනය උපදෙස් අනුව වඩාත් සක්‍රීය අංශයක් ලෙස කැපවී සිටින බව සතුටින් දැනුම් දීමට කැමැත්තෙමු.

මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හී දැන්වීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උපලේඛනගත කිරීම් සහ සමාජ මාධ්‍යයන්හි ප්‍රචාරයන්ය. එය සෑම වර්ෂයකම වැඩිම ආදායම් උපදවන්නේ මාධ්‍ය අංශයේ උපලේඛනගත කිරීම් තුලිනි. ඒ අනුව 2022 වර්ෂයේද වඩාත් කාර්යක්ෂමව සිදුකරන ලදී. මෙහිදී සමස්ත ආයෝජනය රු. මිලියන 120,736,896/- කි.

2022 වර්ෂය ද කොවිඩ් වසංගත තත්වය හමුවේ ආයතනය වරින් වර වසා තැබීමට සිදු උවද අප ලබා ගත් මෙම ආදායම වඩාත් ප්‍රශස්ථ මට්ටමක තිබෙන බවට අපගේ හැඟීමයි මෙහිදී 2020 වර්ෂයේදී මෙන්ම 2022 වර්ෂයේද දැන්වීම් උපලේඛනගත කිරීම් යම් අවස්ථාවන් වලදී නිවසේ සිට සිදුකිරීමට සිදුවිය පෙර වර්ෂය වගේම එහිදිද අපගේ ඉහල කළමනාකාරීත්වය විසින් ඒ සඳහා විශාල සහයෝගයක් මාධ්‍ය අංශය වෙත ලබාදෙන ලදී

තවද රූපවාහිනී හා ගුවන්විදුලි උපලේඛනගත කිරීම් සඳහා අප වෙත විශේෂ වට්ටම් ප්‍රතිශතයක් ලැබෙන අතර මීට අමතරව වර්තමානය වන විට සමාජ මාධ්‍ය ජාලා වෙබ් අඩවී තුල ප්‍රචාරන කාර්යයන් සිදුකිරීම ඉතාමත් ආකර්ෂණීය අංගයක් බවට පත්ව ඇත. ඒ අනුව අපගේ මාධ්‍ය අංශයෙහි සමාජ මාධ්‍ය අශයක් වෙනම ඇත. එහිදී අපගේ නිර්මාණාත්මක කාර්යයන් ප්‍රචාරය කරනු ලබයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ දැන්වීම් ප්‍රචාරන නියෝජිත ආයතනයක් ලෙස අපගේ නිර්මාණ කාර්යයන් පමණක් නොව ප්‍රචාරණයේ ඉහල මට්ටමේ හැකියාවන් සැලසිනෙ සතු බව මෙයින් පෙන්නුම් කෙරේ.

අලෙවි හා පාරිභෝගික සේවා අංශය

2022 වසර තුළ පාරිභෝගික අංශය රුපියල් මිලියන 323,094,325/- ක අලෙවි ආදායමක් උපයා ගත හැකි විය. මෙය අප බලාපොරොත්තු වූ රුපියල් මිලියන 860,000,000/-. ආදායමට වඩා අඩු බවත්, එයට ප්‍රධාන වශයෙන් දැනට රට තුළ පවතින ආර්ථික අවපාතය බලපාන ලදි. එනමුත් පාරිභෝගික අංශය උපයා ගත් අලෙවි ආදායමෙන් වැඩි ලාභ ප්‍රතිශතයක් වාර්තා කිරීමට හැකි වීම විශේෂත්වයකි. මෙයට මූලිකවම දැඩි මූල්‍ය විනයක් මත පිහිටා කටයුතු කිරීම ඉවහල් විය. තවද නිර්මාණාත්මක ප්‍රචාරණ දැන්වීම් නිෂ්පාදනය කිරීමට හැකි වීමද විශේෂත්වයක් වශයෙන් සඳහන් කළ හැක. මෙය අප ආයතනයේ හැරවුම් ලක්ෂයක් වශයෙන් හදුන්වාදිය හැක.

පාරිභෝගික අංශය තව දුරටත් ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස නිදහස් පාරිභෝගික සේවා නිලධාරීන් බදවා ගැනීම සදහා අවශ්‍යය අනුමැතිය ලැබූ අතර, ඒ තුළින් වඩාත් පුළුල් සේවාවක් සේවා ලාභියා හට ලබා දීමට බලාපොරොත්තු වේ.

මානව සම්පත් හා පරිපාලන අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ අභියෝගාත්මක වසරක් ලෙස 2022 වර්ෂයේ මානව සම්පත් හා පරිපාලන අංශය මඟින් සාක්ෂාත් කරගත් අරමුණු පහතින් දක්වා ඇත.

- ආයතනයේ සුභසිද්ධිය උදෙසා දැනුමෙන් හා අත්දැකීම් සම්භාරයකින් සුපෝෂිත පරිණත සාමාන්‍යාධිකාරිවරයෙකු බඳවා ගැනීම.
- ශ්‍රම බලකාය වෙත නිවැරදි නායකත්වයක් ලබාදීම අරමුණු කොට ගෙන ආයතනයේ දුර්වල මූල්‍යමය තත්ත්වයක් යටතේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි පසුබිමක ආයතනයේ සම්පත්දායකයින් හරහා ලිපිගොනු කළමනාකරණය ආදී විශයෙන් වැඩසටහන් පැවැත්වීම.
- වෘත්තිය ප්‍රගමනය සඳහා නිලධාරීන්ගේ පෞද්ගලික ඉල්ලීම් පරිදි විෂයානුබද්ධ පාඨමාලා සඳහා රු. 200,000 ක් දක්වා මූල්‍යමය අනුග්‍රාහකත්වය ලබාදීම සිදුකර ඇත.
- කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය මැන බැලීම තුලින් සේවය සඳහා වන අභිප්‍රේරණය වැඩි කිරීමට පියවර ගෙන ඇත. මේ සඳහා කොන්ත්‍රාත් සේවකයන්ගේ සේවා දිගු ලබාදීමේදී මූලික කාර්යසාධන නිර්ණායක (KPI) මැන බැලීමට කටයුතු කරන ලදී.
- වෙනත් වර්ෂයන්හිදී මෙන්ම සේවකයන් සඳහා සෞඛ්‍ය රක්ෂණාවරණයද ක්‍රියාත්මක කොට ලබාදීමට කටයුතු කරන ලදී.
- යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් ආයතනය පරිශයේ බෝග වගා කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම සහ සේවකයන් වෙත වළලුළු බීජ සහ පළතුරු පැල බෙදා දීම.

නිෂ්පාදන අංශය

නිර්මාණශීලීත්වය හරහා සාර්ථකත්වය වෙත නිෂ්පාදන අංශයෙන් පිම්මක්

ලොව නිමාණශීලී ක්‍රියාවන් බොහොමයක් පිටුපස ඇත්තේ සරල අවශ්‍යතාවක් සහ ඒ වෙනුවෙන් තම මනස වෙහෙස වූ මිනිසුන් සමූහයකි.එම සරල නිර්මාණශීලී සිතුවිලි දැවැන්ත ව්‍යාපාර බවට පත්වන්නේ සාමුහික ප්‍රයත්නයන් හරහායි.සැලසිනෙ ආයතනයේ නිර්මාණශීලී ක්‍රියාවලියේ හදවත බඳු නිෂ්පාදන අංශය සාර්ථකත්වය වෙත ගමන් කරන්නේ සෙසු අංශ සමග සාමුහිකව අත්වැල් බැඳ ගෙනය.

40 වසරක සැලසිනෙ රූපවාහිනී ඉතිහාසය තුළ අප ආයතනය සාර්ථකත්වය වෙත ලඟාවූ සෑම අවස්ථාවකම එහි පෙරමුණේ නිෂ්පාදන අංශය ක්‍රියාකාරී ලෙස දායක වී තිබේ. නිෂ්පාදන අංශය, දෘෂ්‍ය සහ ශ්‍රව්‍ය ලෙස සැලසිනෙ ආයතනයේ මූල්‍ය අංශය ශක්තිමත් කිරීමට ගත වූ සෑම වසරකම කණ්ඩායමක් ලෙස උපරිමයෙන් දායකවී ඇත.

රූපවාහිනී වැඩසටහන්, වෙළෙඳ දැන්වීම්,වාර්තා වැඩසටහන්,ආයතන ප්‍රවර්ධන වැඩසටහන් යන ක්ෂේත්‍ර ඔස්සේ නිර්මාණකරණයෙන් දායක වෙමින් 2022 වසරේ ද නිෂ්පාදන අංශය සිය උපරිමයෙන් කටයුතු කළේ රටේ පවතින දැවැන්ත ආර්ථික අර්බුදයේ අභියෝගයන්ට ද මුහුණ දෙමින්ය.ගතවූ වසර තුළ නව නිර්මාණ සංකල්ප හඳුන්වා දෙමින් තිර පිටපත් රචනා අංශයෙන් ද නිෂ්පාදන අංශය වර්ධනීය පියවරක් තැබීමට කටයුතු කර ඇත.2022 වසරේ නිෂ්පාදන අංශය ලෙස අපගේ ආදායම් ඉලක්කය සියයට සියය ඉක්මවා දායකත්වය දැක්වීමට කණ්ඩායමක් ලෙස කටයුතු කර ඇත්තෙමු.

2023 වසර තුළ තවදුරටත් අප අංශයේ කාර්යක්ෂමතාව මෙන්ම නිර්මාණශීලී ඵලදායීත්වය ඉහළ නංවා ගනිමින් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ මූල්‍ය ශක්තිය ඉහළ නැංවීම සඳහා සෙසු අංශ සමග අත්වැල්බැඳ ගෙන ශක්තිමත්ව ඉදිරියට යාමට සූදානම්ව සිටින බව පවසන්නේ මහත් විශ්වාසයෙනි.

තාක්ෂණික අංශයේ නූතන භාවිතයන් ලෝක පරිමාණව දැවැන්ත පිම්මක් පැන ඇති අවස්ථාවක අප සතු තාක්ෂණික පාර්ශ්වයන් වැඩිදියුණු කර ගැනීම සපුරා ගතයුතු අවශ්‍යතාවක් ලෙස පවතී.2023 වසර එහි වර්ධනීය තලයක් වෙත ලඟාවීම අපගේ අපේක්ෂාවය.

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ ප්‍රවර්ධනය සඳහා වැඩි දායකත්වය නිෂ්පාදන අංශයෙන් ලබාදීමේ වගකීම පැහැර නොහරිමින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට අපි මේ වසර තුළ අදිටන් කරගෙන ඇත්තේ ගෝලීයව මෙන්ම ජාතික වශයෙන් මතුව ඇති අර්බුදයන් ද වටහා ගනිමිනි.

මූල්‍ය අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සියලු මූල්‍ය කටයුතු සිදුකරනු ලබනුයේ අපගේ මූල්‍ය අංශය මඟිනි. 2022 වර්ෂය තුළ දී ගිණුම් කටයුතු යථා තත්වයට ගෙන ඒමට වැඩි වෙහෙසක් දැරීමට සිදු විය. මූල්‍ය අංශයේ සියලු කාර්යයන් කාර්යක්ෂව ක්‍රියාත්මක කිරීම උදෙසා නව විධික්‍රම හඳුන්වා දීම සිදු විය. රජයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සියලුම ගිණුම් කටයුතු සිදු කරනු ලබන අතර, ගෙවිය යුතු ණය මුදල් රාශියක් සැපයුම්කරුවන් වෙත නියමිත පරිදි ගෙවීමට හැකිවිය. ලැබිය යුතු හිඟ මුදල් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් සකස් කෙරුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විගණන විමසුම් අඩුකර ගැනීමට හැකි විය. පැරණි වර්ෂවල ගිණුම් වාර්තා සියල්ල පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට අවශ්‍ය පියවර ගැනීම ද අප ලද ජයග්‍රහණයකි.

ගිණුම් වාර්තා සැකසීම, තොරතුරු අමාත්‍යංශය හා විගණනය වෙත කඩිනමින් ලබා දීම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ඇතුළු පාර්ශ්වයන් වෙත කඩිනමින් ලබා දීමට පියවර ගනු ලැබේ. විගණකාධිපතිගේ මතය 2014, 2015, 2016, 2017, 2018, 2019 යන වර්ෂවලදී මෙන්ම 2020 වර්ෂයේදී ද රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පෙන්නුම් කරන බැවි එකී විගණකාධිපති වාර්තාවේ සඳහන් වීම තුළින් මූල්‍ය අංශය මඟින් සැලසිනෙ රූපවාහිනී ආයතනය වෙත ඉමහත් කීර්තියක් ලබා දී තිබේ. එමෙන්ම 2021 වර්ෂය හා මෙම වර්ෂයට අදාළ විගණකාධිපති මතය ඉතා කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය වාර්තාවන් විගණන අංශය වෙත ලබා දී ඇත.

ඉසව් කළමනාකරණ අංශය


2015 වර්ෂයේ ආයතනය තුල ස්ථාපිත කරන ලද ඉසව් කළමනාකරන අංශය ආරම්භයේ සිට ඉතා ලාභදායී හා ශක්තිමත් අංශයකි. ආයතනයේ ප්‍රගමනය උදෙසා මනා දායකත්වයක් මෙම අංශය තුලින් ලබා දී ඇත. රාජ්‍ය හා පෞද්ගලික අංශයේහි විවිධ ඉසව් සංවිධානය කරමින් මනා ලෙස කළමනාකරණය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. තවද නව ඉසව් සඳහා යෝජනා සකස් කරමින් තරගකාරී වෙළඳපොලෙහි නව තාක්ෂණික ක්‍රමවේද යොදා ගනිමින් සේවා දායකයන් වෙත වඩා ඵලදායී හා ආකර්ෂණීය සේවාවක් මෙම අංශය මගින් ලබා දෙයි. ලාංකේය ඉතිහාසයේ නොමැකෙන අවස්ථා නියෝජනය කරනු ලබන විවිධ සුවිශේෂී ඉසව් කළමනාකරනයේ ප්‍රමුඛයා වීමට සැලසිනෙ රූපවාහිනි ආයතනයට වර්ථමානයේ හැකියාව ලැබී ඇත. ඒ අතර නෙළුම් කුළුණ ජන ගත කිරීමේ උළෙල ජනමාධ්‍ය සම්මාණ උළෙල, චික්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම් උළෙල වැනි සුවිශේෂී අවස්ථා සදහන් කල හැක.

2019 වර්ෂයේ අග භාගයේ සිට 2022 වර්ෂය දක්වා ලොවටම බලපෑම් කල කොවිඩ් 19 වසංගත තත්වය නිසා රට පුරා සියලූ උත්සවයන් අවලංගු කෙරුණු බැවින් අප ආයතනයේ ඉසව් අංශයේ රාජකාරීන්ද සියල්ල තාවකාලිකව නතර වන ලදි. කෙසේ වෙතත් Zoom තාක්ෂණය ඔස්සේ සිදු කරනු ලබන තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් අතථ්‍ය පසුබිම් (Virtual) සහිත ඉසව් කිහිපයක් අප විසින් පවත්වන ලදි.


ඉදිරි වර්ශයන්හිදී අපගේ සේවාව තවතවත් පුළුල් කරමින් සේවාදායකයන් වෙත නව්‍යවාදි තාක්ෂණික මෙවලම් හා උපකරණ භාවිතා කරමින් ඉසව් කළමනාකරණ ක්ෂේත්‍රයේ ගුණාත්මක සේවාවක් ලබා දීම ඉසව් අංශයේ අපේක්ෂා කරනු ලබයි.

මූල්‍ය වාර්තාව 2022

ආදායම් වර්ධනය




පසුගිය වසර පහ තුළ ආදායම් සහ සෘජු වියදමෙහි ප්‍රවණතාවය



2018 - 2022 වසර අතර ආයතනික ලාභයේ උපනතිය

පසුගිය වසර පහ තුළ ආදායම් සහ දළ ලාභයෙහි උපනතිය



ශේෂ පත්‍රය

2022 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන			
දේපළ පිරියත හා උපකරණ	02	13,391,549	16,236,593
අස්පෘෂ්‍ය වත්කම්	02-A	1,007,188	1,607,011
ජංගම නොවන වත්කම්		**14,398,737**	**17,843,604**
ජංගම			
ආයෝජන	03	15,685,129	9,620,988
වෙළඳ හා ලැබිය යුතු වත්කම්	04	326,572,786	385,426,257
වෙනත් ලැබිය යුතු දෑ	05	2,079,163	1,756,187
මුදල් හා සමාන දෑ	06	14,554,112	21,354,358
ජංගම වත්කම්		**358,891,190**	**418,157,790**
මුළු වත්කම්		**373,289,927**	**436,001,394**
ස්කන්ධ හා වගකීම්			
ස්කන්ධය			
රඳවාගත් ලාභය / අලාභය		97,731,501	92,386,368
මුළු ස්කන්ධය		**97,731,501**	**92,386,368**
වගකීම්			
ජංගම නොවන			
උපචිත පාරිතෝෂික දීමනා	07	18,092,000	17,638,518
මුළු ජංගම නොවන වගකීම්		**18,092,000**	**17,638,518**
ජංගම			
වෙළඳ හා ගෙවිය යුතු වෙනත් වියදම්	08	257,336,874	325,773,330
අත්තිකාරම් ලැබීම්		129,552	203,178
මුළු ජංගම වගකීම්		**257,466,426**	**325,976,508**
මුළු ස්කන්ධ හා වගකීම්		**373,289,927**	**436,001,394**

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදෙන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට හා 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව පිළියෙල කර ඇත.

සාමාන්‍යාධිකාරී - සැලසිනෙ රූපවාහිනී ආයතනය

මෙම මූල්‍යමය ප්‍රකාශය සැකසීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබන ලදී.

සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

ආදායම් ප්‍රකාශය

2022 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2022 රු.	2021 රු.
ආදායම්	**09**	**323,094,325**	**463,180,114**
සෘජු පිරිවැය	**10**	243,981,574	342,887,864
දළ ලාභය / අලාභය		**79,112,751**	**120,292,250**
වෙනත් මෙහෙයුම් ආදායම්	**11**	4,808,776	3,013,539
පරිපාලන හා ආයතන වියදම්	**12**	(88,960,264)	(105,265,782)
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	**13**	(7,817,163)	(16,325,262)
මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය		**(12,855,900)**	**1,714,745**
මූල්‍ය වියදම්	**14**	(353,414)	(234,155)
වෙනත් වියදම්	**15**	(1,486,144)	(8,321,592)
බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය/අලාභය		**(14,695,458)**	**(6,841,002)**
ආදායම් බදු		-	-
බදු හර කිරීමට පසු ශුද්ධ ලාභය/අලාභය		**(14,695,458)**	**(6,841,002)**

ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම

2022 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

2022 ජනවාරි 1 දිනට ශේෂය		**92,386,368**
පෙර වර්ෂය සඳහා ගැලපීම්	17	20,040,591
		112,426,959
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / අලාභය		(14,695,458)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		**97,731,501**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2022 රු.	2021 රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය		
බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය	(14,695,458)	(6,841,002)
ගැලපීම්;		
පොලී ආදායම්	(2,732,927)	(1,857,849)
දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වෙන්කිරීම්	3,990,768	3,377,770
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	1,426,268	2,652,247
අඩමාන ණය වෙන්කිරීම්	-	-
පසුගිය වර්ෂයට අදාළ ගැලපීම්	20,040,591	122,232
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**8,029,242**	**(2,546,602)**
වෙළඳ හා අනෙකුත් ලැබීම් (වැඩිවීම් / අඩුවීම්)	58,853,471	(84,985,729)
තැම්පත් සහ කලින් කල ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්)	(322,976)	(1,746,222)
වෙළඳ ණය හිමියෝ හා අනෙකුත් ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්)	(68,436,456)	91,145,007
අත්තිකාරම් ලැබීම් (වැඩිවීම්/ අඩුවීම්)	(73,626)	73,626
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**(9,979,587)**	**1,940,081**
පාරිතෝෂික ගෙවීම්	(972,786)	(1,737,865)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**(10,952,373)**	**202,216**
ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල්		
දේපල පිරියත, යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම්	(545,890)	(12,147,253)
පොලී ආදායම්	2,732,927	1,857,849
ස්ථාවර තැම්පතු	(6,064,141)	23,898,658
ආයෝජන කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**(3,877,104)**	**13,609,254**
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
අඩමාන ණය වෙන් කිරීම	-	-
රඳවාගත් ඉපැයීමේ දෝෂ නිවැරදි කිරීම	-	-
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**-**	**-**
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / අඩුවීම	**(6,800,246)**	**13,811,468**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)	21,354,358	7,542,890
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)	**14,554,112**	**21,354,358**

සටහන A

මුදල් හා මුදල් සමාන දෑ		
ලංකා බැංකුව ජංගම ගිණුම් අංකය - 2323299	880,486	3,540,148
ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගිණුම් අංකය - 2329765	93,963	156,471
මහජන බැංකුව 200100130005980	(5,532,427)	(9,870,147)
මහජන බැංකුව 200100110005980	18,699,530	26,817,817
නිෂ්පාදන අත්තිකාරම්	137,400	434,909
අනෙකුත් අත්තිකාරම්	275,160	275,160
	14,554,112	**21,354,358**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2022 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු කරුණු

1.1 සංයුක්ත තොරතුරු

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන් හැඳින්වෙන) 2019.02.26 වෙනි දිනැති අංක 2112/13 දරන විශේෂ ගැසට් නිවේදනය මඟින් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ප්‍රමාණය

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමනාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

1.3 සේවක ප්‍රමාණය

2022.12.31 වන දිනට 53 ක සේවක ප්‍රමාණයක් සිට ඇත.

2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සාරාංශය

2.1 පොදු ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මග පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ය. ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති අතර, දිගින් දිගටම පවත්වා ගැනීමේ පදනම මත ඉදිරිපත් කර ඇත.

2.2 ස්ථායීතාවය සහ සැසඳුම්

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදා ගත් ප්‍රතිපත්ති සමග අනුකූල වේ.

2.3 ණය පිරිවැය

මෙම ණය පිරිවැය හඳුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙස ය.

3. වත්කම් තක්සේරුව සහ එහි ඇගයුම් පදනම

3.1 දේපල පිරියත සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා සකස් කර ඇත.

3.2 වෙළඳ සහ ලැබිය යුතු දෑ

වෙළඳ සහ ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

3.3 මුදල් සහ මුදල් වලට සමාන දෑ

මුදල් සහ මුදල් වලට සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු කෙටිකාලීන ඉහළ ද්‍රව ශීලතාවය ඇති ආයෝජන මෙයට ඇතුළත් වේ.

3.4 ක්ෂය කිරීම

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගතකර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදු කර ඇත.

එක් එක් අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත පරිදි වන අතර, එහි පවත්නා ඇස්තමේන්තු ඵලදායී කාලය සහ සාපේක්ෂ කාලය පහත පරිදි වේ.

ලී බඩු සහ සවිකිරීම්	වර්ෂ 10
පරිගණක උපකරණ	වර්ෂ 05
කාර්යාලයීය උපකරණ	වර්ෂ 10
මෝටර් වාහන	වර්ෂ 05
කැමරා සහ චිත්‍රපට උපකරණ	වර්ෂ 10
පරිගණක මෘදුකාංග	වර්ෂ 10

මෝටර් වාහන සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති අතර පොත් වටිනාකර රුපියල් 7,835,824 කි.

3.5 ස්ථාවර වත්කම් බැහැර කිරීම

2018 වසරේ වත්කම් මිලදී ගැනීම හඳුනා නොගෙන බැහැර කර ඇත.

4. වගකීම් සහ ප්‍රතිපාදන

4.1 වගකීම් වර්ගීකරණය වන්නේ ඉල්ලුම මත ගෙවීමට බැඳී සිටින පවත්නා ශේෂ පත්‍රයේ වගකීම් හෝ ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ය. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් ලෙස අයිතම වර්ගීකරණය වී ඇත.

4.2 විශ්‍රාම සහ ප්‍රතිලාභ දීමනා

සේවක ප්‍රතිලාභ - LKAS 19 (සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන ප්‍රතිලාභ දීමනා පනතට අනුකූලව වී යටතේ වසර 05 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

ව්‍යවස්ථාව සහ රෙගුලාසිවලට සමගාමීව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයට සුදුසුකම් ලබනු අතර, ආයතනය විසින් 15% ක සහ 3% ක් සේවකයින්ගේ මුළු වේතන ප්‍රමාණයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායක වේ.

5 ආදායම් ප්‍රකාශය

5.1 පිරිවැටුම

සැලසිනෙ පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, මුද්‍රණ, පුවත්පත් වෙළඳ දැන්වීම් උපලේඛනගත කිරීම්, ඉසව් කළමනාකරණ, සමාජ මාධ්‍ය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

5.2 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සසම්භාවී ලෙස ගලා ඒමේ ප්‍රමාණය සහ ආදායම් විශ්වාසී ලෙස ගණනය කිරීම ආදායම් හඳුනා ගැනීම ලෙස හැඳින්වේ.

5.3 වියදම් හඳුනා ගැනීම

වියදම් හඳුනා ගැනීම ආදායම් ප්‍රකාශනයේ සෘජු සම්බන්ධතාවය අතර පිරිවැය සහ විශේෂී අයිතම සඳහා වූ ආදායම් ඉපැයුම් පදනම මත වියදම් හඳුනා ගැනීම සිදු කරනු ලැබේ.

6. අදාළ පාර්ශව අතර ගනුදෙනු

LKAS 24 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන කාලය තුළ අදාළ පාර්ශව අතර ගනුදෙනු කිසිවක් සිදුකර නොමැත.

7. ශේෂ පත්‍ර දිනයට සිදුවීම් වලට අදාළ පසු ගැලපුම් සටහන්

7.1 මූල්‍ය වාර්තාවෙහි හෙලිදරව් කළ යුතු හෝ ගැළපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

8. බොල් හා අඩමාණ ණය වෙන් කිරීම.

ණයගැතියන් සඳහා අඩමාණ ණය ලෙස 5 % ක් වෙන්කර තිබේ. (දින 90 ට වැඩි ණයගැතියන් සඳහා)

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2022 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

සටහන් - 02 දේපල පිරියත හා උපකරණ

	01.01.2022 දිනට පිරිවැය රු.	එකතු කිරීම් / මාරු කිරීම් රු.	ඉවත් කිරීම් / මාරු කිරීම් රු..	31.12.2022 දිනට පිරිවැය රු.
02.1 දළ වත්කම්				
ලීබඩු සහ සවිකිරීම්	11,098,227	-	-	11,098,227
පරිගණක උපාංග	10,849,339	-	-	10,849,339
කාර්යාල උපකරණ	7,687,437	545,890	-	8,233,327
මෝටර් රථ	7,835,824	-	-	7,835,824
කැමරා සහ උපකරණ	15,169,000	-	-	15,169,000
	53,639,827	**545,890**	**-**	**53,185,717**

	01.01.2022 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ක්ෂය / මාරු කිරීම් රු.	ඉවත් කිරීම් / මාරු කිරීම් රු.	31.12.2022 දිනට ශේෂය රු.
02. 2 ක්ෂයවීම්				
ලී බඩු සහ සවිකිරීම්	2,910,875	1,012,591	-	3,923,466
පරිගණක උපාංග	7,868,836	705,699	-	8,574,535
කාර්යාල උපකරණ	4,026,130	579,100	-	4,605,230
මෝටර් රථ	7,835,824	-	-	7,835,824
කැමරා සහ උපකරණ	13,761,569	1,093,544	-	14,855,113
	36,403,234	**3,390,935**	**-**	**39,794,168**
	16,236,593			**13,391,549**

සටහන - 02-A අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ මෘදුකාංග	3,389,000	-	-	3,389,000
ජාලකරණ මෙහෙයුම්	3,419,651	-	-	3,419,651
	6,808,651	**-**	**-**	**6,808,651**
ක්‍රමක්ෂය				
ගිණුම්කරණ මෘදුකාංග	2,552,569	257,858	-	2,810,427
ජාලකරණ මෙහෙයුම්	2,649,071	341,965	-	2,991,036
	5,201,640	**599,823**	**-**	**5,801,463**
	1,607,011			**1,007,188**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2022 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2022 රු.	2021 රු.
සටහන - 03 - ආයෝජන			
ලංකා බැංකුව - ගිණුම් අංකය 8162593		500,000	500,000
ණයකර - ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව		-	398,200
ලංකා බැංකුව - ගිණුම් අංකය 83636019		7,000,000	7,000,000
ලංකා බැංකුව - ගිණුම් අංකය 84622785		1,803,417	1,722,788
මහජන බැංකුව - ගිණුම් අංකය 2006001000068281		5,381,712	-
මහජන බැංකුව - ගිණුම් අංකය 200600100007202-5		1,000,000	-
		15,685,129	**9,620,988**
සටහන - 04 - වෙළඳ හා ලැබිය යුතු දෑ			
වෙළෙඳ ණය ගැතියෝ	**සටහන 04.1**	282,658,821	334,299,970
උත්සව අත්තිකාරම්	**සටහන 04.2**	1,813,822	2,512,241
අත්තිකාරම් ගෙවීම		20,125,000	23,741,000
ලැබිය යුතු රක්ෂණ වාරික		41,800	41,800
රඳවා ගැනීමේ බදු		82,459	82,459
ආර්ථික සේවා ගාස්තු		3,599,744	3,599,744
උපාලි පුවත්පත් සමාගම		-	10,695
ලැබිය යුතු දඩ හා අධිභාර		194,068	194,068
එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම		-	2,538,029
විජය පුවත්පත් සමාගම		-	188,651
ඊ.වී.පි		-	3,004
ලැබිය යුතු කොමිස් මුදල - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව		-	63,558
ආපසු ගෙවන තැන්පතු		5,544,100	5,639,100
ලැබිය යුතු බැංකු පොලී ආදායම්		93,904	92,870
සේවක මුදල් වංචාව	**සටහන 04.3**	11,988,000	11,988,000
විවිධ ලැබීම්		63,151	63,151
ඊ-මංසල පාලන ගිණුම		367,917	367,917
		326,572,786	**385,426,257**
සටහන - 04.1 - වෙළෙඳ ණයගැතියෝ			
වෙළෙඳ ණයගැතියෝ		296,200,514	347,262,234
අඩු කලා -ණයගැති ලැබීම්		(755,272)	(755,273)
අඩු කලා - බොල් ණය සඳහා වෙන් කිරීම්		(12,786,421)	(12,206,991)
		282,658,821	**334,299,970**
සටහන - 04.2 - සේවක ණයගැතියෝ			
උත්සව අත්තිකාරම්		25,000	20,000
සේවක ණය		1,453,400	2,118,756
සේවකයන්ගෙන් ලැබිය යුතු - වෙනත්		112,320	23,021
සේවක රක්ෂණ		223,102	350,464
		1,813,822	**2,512,241**

සටහන - 04.3 - සේවක මුදල් වංචාව

ආයතනයේ සේවකයන් විසින් නිසි අධිකාරියකින් තොරව මුදල් ලබාගෙන කරන ලද මූල්‍ය වංචාව පිලිබඳව මේ වන විට නඩුවක් ගොණුකර ඇති අතර, මෙම මුදල් අදාල පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට අදාළ නීතිමය කටයුතු කරගෙන යනු ලැබේ.

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2022 රු.	2021 රු.
සටහන - 05 - කලින් ගෙවීම් සහ වෙනත් ලැබීම්			
කලින් ගෙවීම්		2,079,163	1,756,187
		2,079,163	**1,756,187**
සටහන - 06 - මුදල් මුදල් සමාන දෑ			
ලංකා බැංකුව ගි.අ. 2323299		880,486	3,540,148
ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගි.අ. 2329765		93,963	156,471
මහජන බැංකුව (ජංගම) ගි.අ. 200100130005980		(5,532,427)	(9,870,147)
මහජන බැංකුව (ඉතිරි කිරීමේ) ගි.අ. 200200110005980		18,699,530	26,817,817
නිෂ්පාදන අත්තිකාරම් (නොපියවූ)		137,400	434,909
වෙනත් අත්තිකාරම් (නොපියවූ)		275,160	275,160
		14,554,112	**21,354,358**
සටහන - 07 - ගෙවිය යුතු පාරිතෝෂික			
ඉ / ගෙ ශේෂය		17,638,518	16,724,136
පාරිතෝෂික වියදම් වර්ෂය සඳහා		1,426,268	2,652,247
		19,064,786	19,376,383
පාරිතෝෂික ගෙවීම්		(972,786)	(1,737,865)
ගෙවිය යුතු පාරිතෝෂික		**18,092,000**	**17,638,518**
සටහන - 08 - වෙළෙඳ හා අනිකුත් ගෙවිය යුතු දෑ			
වෙළෙඳ ණයහිමියෝ		177,326,059	208,337,990
දුරකතන ගාස්තු		47,303	47,303
ගෙවිය යුතු අලෙවි කොමිස්		544,826	1,934,634
උපචිත මුද්දර ගාස්තු		8,925	22,225
චිකතුකල අගය මත බද්ද		32,545,718	32,300,238
ජාතිය ගොඩනැගීමේ බද්ද		-	24,437,590
ගෙවිය යුතු ගෙවල් කුළී		900,000	900,000
වෙනත් ණය හිමියෝ හා වෙනත් ගෙවීම්		9,692,862	21,578,759
ඉන්ධන		41,651	41,651
වැටුප් පාලන ගිණුම		140,580	127,766
අවිනිශ්චිත ගිණුම		10,353	10,353
පාලන ගිණුම - Vision 2020 President Secretariat		616,896	616,896
උපචිත වියදම්		35,391,700	35,347,925
ආපසු ගෙවන තැන්පතු		70,000	70,000
		257,336,874	**325,773,330**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2022 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2022 රු.	2021 රු.
සටහන - 09- ආදායම්		
නිෂ්පාදන	134,957,292	87,521,891
ග්‍රැෆික් සහ මුද්‍රණ කටයුතු	63,719,024	90,719,565
උපලේඛනගත කිරීම්	120,736,896	279,826,429
ඉසව් කළමනාකරණය	1,336,363	1,939,515
සමාජ මාධ්‍ය/ වෙබ්/ වෙනත් ආදායම්	2,344,750	3,172,714
	323,094,325	**463,180,114**
සටහන - 10 - සෘජු පිරිවැය		
නිෂ්පාදන වියදම්	95,409,217	86,491,534
ග්‍රැෆික් හා මුද්‍රණ වියදම්	52,079,047	76,793,094
උපලේඛනගත වියදම්	93,335,210	157,440,346
ඉසව් කළමනාකරණ වියදම්	1,114,250	1,610,000
සමාජ මාධ්‍ය වියදම්	2,043,850	1,117,000
නිර්මාණාත්මක නියෝජිත ආයතන කොමිස්	-	19,435,891
	243,981,574	**342,887,864**
සටහන - 11 - වෙනත් ආදායම්		
සේවක ණය පොළී	66,215	96,120
බැංකු පොළී	3,196,301	1,761,729
අඩමාණ ණය අධි වෙන්කිරීම්	-	29,572
ආපසු නොගෙවන තැන්පතු ආදායම	-	17,000
වෙනත් ආදායම්	421,260	86,118
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්	1,125,000	921,500
නිර්මාණ ආදායම්	-	101,500
	4,808,776	**3,013,539**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2022 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2022 රු.	2021 රු.
සටහන - 12 - පරිපාලන හා ආයතන වියදම්		
වැටුප් හා වේතන	41,637,140	41,327,530
සේවක අර්ථ සාධක අරමුදල	5,556,740	5,941,358
සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල	1,112,250	1,188,988
දීමනා	335,247	328,991
දීමනා - සභාපති	1,500,000	1,569,402
දීමනා - කොන්ත්‍රාත් සේවාවන්	58,459	301,507
දීමනා - පුහුණු	37,000	124,000
දීමනා - ප්‍රවාහන	1,347,000	443,540
දීමනා - ඉන්ධන	1,246,680	540,728
දීමනා - දුරකතන	1,183,250	1,624,333
සේවක අතිකාල සහ යැපීම් දීමනා	5,786,673	8,595,612
ගීණුම් ගාස්තු	425,000	340,000
විගණන ගාස්තු	200,000	200,000
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම්	58,890	10,570
දීමනා - අධ්‍යක්ෂක මණ්ඩල	267,500	255,000
ටෙන්ඩර් කමිටු සහ තාක්ෂණික කමිටු සමාජික ගාස්තු	187,000	409,500
ප්‍රසාද දීමනා	-	1,155,000
ගොඩනැගිලි වියදම්	-	7,779,000
ගොඩනැගිලි කුළී වියදම් - ජාතික චිත්‍රපට සංස්ථාව	945,000	3,780,000
ගොඩනැගිලි කුළී වියදම්	8,100,000	2,700,000
පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක වියදම්	15,000	34,550
පරිගණක උපාංග අලුත්වැඩියා වියදම්	200,800	42,350
ක්ෂය වීම්	3,390,934	2,726,904
විදුලිය	2,155,150	748,303
පාරිතෝෂික දීමනා	1,324,243	2,652,247
ගෙවල් කුලි	-	360,000
අන්තර්ජාල වියදම්	423,456	342.234
කම්කරු වියදම්	-	34,500
පුවත්පත් මිලට ගැනීමේ වියදම්	33,130	81,210
කාර්යාලීය උපකරණ අලුත්වැඩියා වියදම්	457,298	588,365
කාර්යාල නඩත්තු වියදම්	348,706	4,144,647
තැපැල් ගාස්තු	27,855	8,150
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	3,519,578	2,124,448
ගිවිසුම් අලුත්කිරීමේ ගාස්තු	136,500	32,500
ලියාපදිංචි ගාස්තු	104,427	162,748
සංග්‍රහ වියදම්	41,817	721,078

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2022 රු.	2021 රු.
ආරක්ෂක සේවා වියදම්	1,313,130	811,356
සේවක රක්ෂණය	2,795,769	1,040,499
සේවක සුභසාධනය	797,071	1,656,264
විදුලි උද්පාදන වියදම්	220,250	-
පද්ධති නඩත්තු කිරීමේ වියදම්	8,000	120,690
දුරකතන ගාස්තු	312,363	424,776
පුහුණු කිරීමේ වැඩසටහන්	109,000	619,050
පුහුණු කිරීම් හා සංවර්ධන වැඩසටහන්	123,120	200,000
වාහන කුලි	703,462	6,600,398
ජල වියදම්	404,916	281,175
වෙබ් අඩවි සඳහා දරණ ලද වියදම්	-	74,400
වෙනත් වියදම්	-	17,880
විගණන හා කළමනාකරණ වියදම්	10,460	-
	88,960,263	**105,265,782**

සටහන - 13 - විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්

ඉන්ධන වියදම්	1,566,171	2,557,319
මෝටර්රථ වාහන අළුත්වැඩියා වියදම්	1,706,520	1,273,827
අලෙවි දිරි දීමනා	755,820	3,782,682
අලෙවි ප්‍රවර්ධන හා ප්‍රචාරණ වියදම්	178,700	1,548,072
විශේෂ වට්ටම්	2,753,634	3,891,987
ඌණ අඩමාණ ණය වෙන්කිරීම්	579,430	-
මුද්දර ගාස්තු	19,480	494,106
ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීමේ ගාස්තු	146,761	2,666,299
වාහන රක්ෂණය	-	62,530
ටෙන්ඩර් ගාස්තු	110,647	48,440
	7,817,163	**16,325,262**

සටහන - 14 - මූල්‍ය වියදම්

බැංකු ගාස්තු	245,850	228,797
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	107,564	5,358
	353,414	**234,155**

සටහන - 15 - වෙනත් වියදම්

ආයතනික සාමජ වගකීම් ව්‍යාපෘති වියදම්	-	5,818,520
ගිණුම්කරණ මෘදුකාංග - ක්‍රමක්ෂය	257,858	308,900
වත්කම් විකිණීමේ ලාභය	-	77,448
ජාලකරණ මෙහෙයුම් - ක්‍රමක්ෂය	341,965	341,965
නෛතික වියදම්	771,000	1,150,403
අධිභාර	19,424	164,035
පරිත්‍යාග	72,097	420,000
වෙනත් වියදම්	23,800	40,321
	1,486,144	**8,321,592**

සටහන - 16 - සම්බන්ධිත පාර්ශවයන් හෙලිදරව් කිරීම (LKAS 24)

නම	තනතුර	සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ස්වභාවය	ලිපිනය
හරිත් ගුණවර්ධන මහතා	සභාපති	වැටුප් හා වේතන රු. 2,986,126.60	අංක.181/බී 6, සුහද මාවත ඇරැව්වල, පිළියන්දල
ඩබ්ලිව්. එල්. ඒ. කේ. ඒ. ගුණතිලක	සාමාන්‍යාධිකාරී	වැටුප් හා වේතන රු. 873,660.00	අංක. 03/40, නිවුන්ගම පිළියන්දල

2022 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එක් එක් පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශව ගනුදෙනු සිදුනොවීය.

සටහන - 17 - පෙර වර්ෂයේ ගැලපීම්

පෙර වර්ෂයන්ට ගෙවීම් නිවැරදි කිරීම	(4,396,999)
ජා. ගො. බදු ගැලපීම්	24,437,590
	20,040,591

සටහන - 18 - ගොඩනැගිලි නඩත්තු වියදම්

කල්බදු ගිවිසුමේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ කල්බදු සීමාව වන වසර 05 ක කාලය තුල ආයතනය විසින් ප්‍රාග්ධන ස්වභාවයක් ගන්නා ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් කපා හරිනු ඇත.

2022 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපතිතුමාගේ මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිඒඑම්/බී/සැලසිනේ/1/එෆ්ඒ/2022 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 සැප්තැම්බර් 08 දින

සභාපති

සැලසිනේ රූපවාහිනී ආයතනය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 06 වන වගන්තියට අනුව මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල්,ඉල්ලුම් තැන්පතු හා කෙටිකාලීන ආයෝජන පමණක් ඇතුලත් විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් දිනට නොපියවූ නිෂ්පාදන හා අනෙකුත් අත්තිකාරම් ශේෂයන් රු.412,560 ක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ හඳුනාගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම සම්බන්ධව පහත දෑ නිරීක්ෂණය විය.

(i) දැනට සේවය කරනු ලබන නිලධාරීන් වෙනුවෙන් ආදායම් ප්‍රකාශනයට සමාලෝචිත වර්ෂය තුල හඳුනාගන්නා ලද පාරිතෝෂික වියදම් රු.1,324,243 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී බදු පෙර ශුද්ධ ලාභයට ගැලපිය යුතු වුවද 2021 වර්ෂයට අදාලව ගෙවිය යුතු මුළු පාරිතෝෂික වටිනාකම් රු.102,025 ක් ද ඇතුළුව මුළු පාරිතෝෂික වියදම් ලෙස රු.1,426,268 ක් බදු පෙර ලාභයට ගලපා තිබුණි.

(ii) ණයගැතියන් සඳහා හානිකරණ අලාභය රු.579,430 බදු පෙර ලාභයට ගලපා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුලදී රඳවාගත් ඉපයුම් වලට ගලපා තිබුණු රු.20,040,591ක වටිනාකම් මුදල් නොවන ගණුදෙනුවක් ලෙස බදු පෙර ශුද්ධ ලාභයට එකතු කර තිබුණි.

(ඇ) (i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 වන වගන්තියට අනුව පූර්ව වර්ෂ වල සිදු වී ඇති වැරදි සහ අවප්‍රකාශනයන් සමාලෝචිත වර්ෂය තුල දී නිවැරදි කිරීමේ දී පසුගිය වර්ෂයේ අවසන් දිනට පවතින ශේෂයන් අතීතයට බලපාන පරිදි නැවත ප්‍රකාශනය කල යුතු වුවත් රු.4,396,999 ක් එකතු වටිනාකමකින් යුත් 2021 වර්ෂය තුල සිදු වූ වැරදි ශේෂය නිවැරදි කිරීමේ දී 2021 වර්ෂයේ අවසන් වත්කම් සහ වගකීම් ශේෂයන් නැවත ප්‍රකාශනය කර නොතිබුණි.

එමෙන්ම මෙම ප්‍රමිතිය අනුව පූර්ව වර්ෂයේ සිදු වී ඇති වැරදි වල ස්වභාවය සහ නිවැරදි කරන ලද වටිනාකම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වුවත් එම වටිනාකම් වල එකතුවක් පමණක් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර තිබුණි.

(ii) එමෙන්ම පසුගිය වර්ෂයට අදාල රඳවාගත් ඉපයුම් වලට ගලපන ලද මෙම වටිනාකම් වල එකතුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පෙර ශුද්ධ ලාභයට ගලපා තිබුණු අතර කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වන වගන්තිය අනුව සියළුම දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදී ම කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර පිරිවැය රු.32,769,883 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත හා උපකරණ දැනට භාවිතයේ පැවතුණි. එම ප්‍රමිතියෙහිම 79හි (b) වගන්තිය අනුව දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත හා උපකරණ වල දල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු වුවත් වාහන වල හැර අනෙකුත් සියළුම දේපල පිරියත හා උපකරණ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 හි 17 වන වගන්තිය අනුව ආයතනයේ සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල තොරතුරු හෙළිදරව් කල යුතු වුවත් සැලසිනේ ආයතනයෙහි සම්බන්ධිත පාර්ශවයන් යටතේ ප්‍රධාන කළමනාකාරීත්වයට අයත් අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 34 සහ 89 වන වගන්තිය ප්‍රකාරව 2014 වර්ෂයේ ආයතනයේ සිදු වී ඇති රු.11,988,000ක් වූ සේවක මුදල් වංචාව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල සටහනකින් පමණක් හෙළිදරව් කල යුතු වුවද මෙම ශේෂය 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ හා ලැබිය යුතු දෑ තුළ දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය තත්වය රු. 11,988,000 කින් අධිතක්සේරු වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු රු.97,850 ක් පිරිවැය වූ පරිගණක උපකරණ වටිනාකම, කාර්යාලීය උපකරණ සහ පරිගණක උපකරණ නඩත්තු වියදම් ගිණුම් වලට පිළිවෙළින් රු.39,800 ක් සහ රු.58,050 ක් වශයෙන් වෙන් වෙන් ව සටහන් කර තිබුණි.ඒ හේතුවෙන් පරිගණක උපකරණ රු.97,850 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර කාර්යාල උපකරණ රු.39,800 කින් වැඩියෙන් දක්වා තිබුණි.තවද පරිගණක උපකරණ නඩත්තු වියදම් රු.58,050 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර පරිගණක උපකරණ ක්ෂය රු.9,175 කින් අඩුවෙන් සහ කාර්යාල උපකරණ ක්ෂය රු.3,500 කින් වැඩියෙන් ගිණුම් වලට සටහන් කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති බැංකු පොලී ආදායම රු.3,196,301 ක් වුවද විගණන ගණනය කිරීම් අනුව බැංකු පොලී ආදායම රු.3,697,430 ක් වූයෙන් වර්ෂයේ පොලී ආදායමෙහි රු.501,129 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) විගණන ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු බැංකු පොලී ආදායම රු.390,138 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු.93,904 ක වටිනාකමක් පමණක් දක්වා තිබීම හේතුවෙන් ලැබිය යුතු බැංකු පොලී ආදායම රු.296,234 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඒ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.15,685,129 ක් වූ ස්ථාවර තැන්පතු වටිනාකම තුල ඇතුලත් රු. 7,185,129 ක් වූ කල්පිරීමේ කාලය මාස 03 ට වැඩි ස්ථාවර තැන්පතු දෙකක එකතු වටිනාකම බැංකුව විසින් එවන ලද ශේෂ සනාථන අනුව රු.7,347,321ක් වුයෙන් රු.162,192ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) සමාලෝචිත වර්ෂය තුල දී දරන ලද වාහන සඳහා රක්ෂණ වියදම් සහ බලපත්‍ර ගාස්තු වියදම් රු.107,564 ක් ආයතන සහ පරිපාලන වියදම් යටතේ දැක්විය යුතු වුවද ඒ වෙනුවට මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය වියදම් යටතේ වර්ගීකරණය කර තිබුණි.

(ඕ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ගිණුමේ අවසාන ශේෂයක් නොතිබුණු නමුත් 2021 වර්ෂයේ රු.755,272 ක ආරම්භක ශේෂයක් ලෙජර ගිණුමෙහි දක්නට ලැබුණු අතර එම වටිනාකමින්ම අවසාන ශේෂයක් ද පැවතුණි.එම ශේෂය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ද ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර 2022 දෙසැම්බර් 31 දිනටද එම ශේෂය පැවතුණි.මෙම ශේෂය ණයගැතියන්ගෙන් ලද මුදලක් බවත් තහවුරු කිරීමට කළමනාකාරිත්වය අපොහොසත් විය.

(ක) මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්වෙන එකතු වටිනාකම රු.644,534ක් වූ ජංගම වත්කම් ශේෂ 03ක් සහ එකතු වටිනාකම රු.1,745,755 ක් වූ ජංගම වගකීම් ශේෂ 06ක් වර්ෂ 07 ක් තිස්සේ එකම අගයකින් පැවති අතර එම ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

(ග) ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ හා ලැබියයුතු ශේෂ සහ වෙළඳ හා ගෙවියයුතු ශේෂ අදාළ ණයගැති හා ණයහිමි ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සමඟ සැසඳීමේදී ආයතන 02කට අදාලව මූල්‍ය ප්‍රකාශන වල වෙළඳ හා ගෙවියයුතු ශේෂ 02 ක එකතු වටිනාකමෙහි රු.2,153,216 ක වෙනසක් සහ තවත් ආයතන 02කට අදාලව ගෙවියයුතු ශේෂයෙහි රු. 5,733,282ක වෙනසක් නිරීක්ෂණය

විය.තවද ආයතන 03කින් වෙළඳ හා ලැබියයුතු ශේෂ 03ක එකතු වටිනාකමෙහි රු.2,666,376 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ව) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට නියෝජිත කොමිස් රු.1,864,496 ක් සැලසිනේ ආයතනයට ගෙවිය යුතුව තිබුණු අතර සැලසිනේ ආයතනයේ මුල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂයක් දක්වා නොතිබුණි.

(ඡ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 3(1) වගන්තියට අනුව යම් පුද්ගලයෙකු විසින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු එම පුද්ගලයා විසින් අදාළ තක්සේරු වර්ෂයේ අදාල කාර්තුව සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් හිලව් කල හැකි වේ.එසේ වුවද ආයතනය ආරම්භ කරන ලද 1982 වර්ෂයේ සිටම ආදායම් බදු ගෙවා නොතිබුනු පසුබිමක වර්ෂ 10 කට ආසන්න කාලයක සිට ලැබීමට හිමිකමක් නොමැති රු. 3,599,749 ක ශේෂයක් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු ලෙස මුල්‍ය තත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළඳ ණයගැති ශේෂය රු.296,200,514ක් වූ අතර ඉන් රු.199,951,344ක් හෙවත් ණයගැති ශේෂයෙන් සියයට 68ක් වර්ෂ 4 ඉක්මවූ ණයගැතියන්ගෙන් සමන්විත විය.මුළු ණයගැති ශේෂය තුල ඇතුලත් වර්ෂය ඉක්මවූ ණයගැති ශේෂය රු. 230,806,816ක් හෙවත් සියයට 78ක් වූ අතර එම ශේෂයන් අයකර ගැනීම සඳහා ආයතනය ආරම්භයේ සිටම නීතිමය ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ඩ) මෙම මුළු ණයගැති ශේෂය තුල 2006 වර්ෂයේ සිට පවතින රු.6,611,743 ක හඳුනානොගත් ණය ගැති ශේෂයක් ද ඇතුලත් වූ අතර එම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල දීද කටයුතු කර නොතිබුණි.

(ත) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මුළු ණයගැති ශේෂය තුල ඇතුලත් වර්ෂ අට ඉක්ම වූ ශේෂය රු.94,716,244 ක් වූ අතර එම ශේෂය අයකරගැනීම සඳහා කාලවරෝධ පනත යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව අවදානමට ලක්වී තිබුණි.

(ද) ණයගැතියන් විසින් ඉල්ලුම් කරන ලද සේවය සැලසිනේ ආයතනය විසින් නිසි පරිදි ඉටු නොකිරීම,වෙනස් රේටයන් අනුව ගණනයකිරීම් සිදු කිරීම සහ වෙනත් හේතු දක්වමින්, සමාලෝචිත වර්ෂය අවසන් දිනට එකතු වටිනාකම රු.542.768 ක් වූ ණයගැති ශේෂයක් සඳහා ගෙවීම් සිදු කල නොහැකි බවට රාජ්‍ය ආයතන 05ක් විසින් ආයතනය වෙත දන්වා තිබුණි.ඒ පිළිබඳව කරුණු අධ්‍යයනය කොට එම ශේෂ නිරවුල් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආයතනය කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර

කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව,ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඊ),(ඡ),(න) ඡේද වල සඳහන් කරුණු හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව/ පහත සඳහන් නිරීක්ෂණ හැර අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	වටිනාකම රු.	නිරීක්ෂණ
(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි අංක 371(2) (ආ) වගන්තිය	399,200	එක් අවස්ථාවක දී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 02 කදී එම සීමාව ඉක්මවා රු.399,200 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.
(ආ) සංශෝධිත මුදල් රෙගුලාසි අංක 371(5) වගන්තිය		නිකුත් කරන ලද අතුරු අග්‍රිමයක වියදම් නොවී ඉතිරිවන ශේෂය ගණන්දීමේ නිලධාරියා විසින් නියම කෙරෙන අවස්ථාවකදී හෝ ඊට ප්‍රථම නැවත පියවිය යුතුය. කවර අන්දමකින් වුවද එසේ භාරදීම, එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 වැනි දින හෝ

ඊට පෙර සිදුකළ යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් දිනට නොපියවූ අත්තිකාරම් ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශන වල රු.412,560ක ශේෂයක් දක්වා තිබුණු අතර අත්තිකාරම් ලේඛණ පරීක්ෂා කිරීමේදී වර්ෂය තුළ නිකුත් කළ සියලු අත්තිකාරම් පියවා ඇති බවට සටහන් යොදා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - මුදල් රෙගුලාසි 754

සෑම මුදල් වර්ෂයකම අවසානයේදී තොග වට්ටෝරු ලේඛණය තුලනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සිදුකරන අවස්ථාව වනවිටත් තොග වට්ටෝරු ලේඛණය යාවත්කාලීනව නොපැවති අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එය තුලනය කර නොතිබුණි. භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව තොග වට්ටෝරු ලේඛණයේ පවතින තොග ශේෂයන් සහ සත්‍ය වශයෙන් පවතින ශේෂයන් අතර භාණ්ඩ වර්ග 82කට අයත් අයිතම් 339ක් අස්ථානගත වී ඇති බවටත්, භාණ්ඩ වර්ග 43කට අයත් අයිතම් 84ක් අපහරණය කර ඇති බවටත්, වට්ටෝරු ලේඛණයේ සඳහන් ශේෂය ඉක්මවා භාණ්ඩ වර්ග 6කට අයත් අයිතම් 114ක සත්‍ය තොග පැවති බවටත්, ලේඛණයට ඇතුලත් නොවූ භාණ්ඩ වර්ග 16කට අයත් අයිතම් 53ක් පැවති බවටත් නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි. එසේ වූ අතිරික්තයන් සහ ඌණතා වලට අදාල ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව තොග ශේෂයන් නව තොග වට්ටෝරු පොතක් වෙත මාරු කිරීමට කටයුතු කර තිබුණි.

(ඇ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) (අ) වගන්තිය

යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළහැකි ආදායමක් ලබන තැනැත්තෙකු විසින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද ගෙවනු ලැබියයුතු වුවත් 1982 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබූ සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් මෙම වාර්තාවේ දිනය වන විටත් ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව

(අ) සමාලෝචිත වර්ෂය තුල අවස්ථා පහකදී සිදුකරන ලද එකතු වටිනාකම රු.7,127,028 ක් වූ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ආ) මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවස්ථා තුනකදී එකතු වටිනාකම රු. 3,163,500 ක්වූ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(අ) මාර්ගෝපදේශයට පටහැනිව එකම සාමාජිකයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව යන දෙකෙහිම සේවය කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට අනුමැතිය ලබාදීමේදී ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.11.1 මාර්ගෝපදේශය ප්‍රකාර ප්‍රසම්පාදන කාල සටහන, ප්‍රධාන දින, ලේඛන නිකුතුව, ලංසු /යෝජනා බාර ගැනීම අවසන් දිනය, කොන්ත්‍රාත්තුව පිරිනැමීම ආදීය ප්‍රසම්පාදන මණ්ඩලය විසින් සකස් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කාල සටහන, ප්‍රසම්පාදන ක්‍රමය හා ලංසු කැඳවීමේ ලේඛන වර්ග පිළිබඳව එකඟවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඒකාබද්ධ පළමු රැස්වීමක් ද පවත්වා නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 ඡේදය ප්‍රකාර, ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් හා ලිපිකරු නිලධාරීන් විසින් එම කමිටුවල පළමු රැස්වීමේදී ප්‍රසම්පාදන අත්පොතෙහි දක්වා ඇති රහස්‍යභාවය ප්‍රකාශ කරන ආකෘති පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 මාර්ගෝපදේශය අනුව ලංසු සුරක්ෂණ සහතිකය හා 5.4.8 මාර්ගෝපදේශය අනුව කාර්ය සාධන සුරක්ෂණ ලබාගත යුතු වුවද අවස්ථා තුනකදී එකතු වටිනාකම රු.12,400,200 ක්වූ ප්‍රසම්පාදනයන් තුනක් සම්බන්ධයෙන් ඒඅනුව කටයුතුකර නොතිබුණි.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(අ) මාර්ගෝපදේශයට අනුව ලංසු විවෘත කිරීමේ කමිටුව පත්කර ඇති බවට සාක්ෂි නොතිබුණු අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳ අවසාන තීරණය ගනු ලැබූ විගස ප්‍රතිග්‍රහණ ලිපියක්ද නිකුත් කර නොතිබුණි.

(උ) මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.8.1 (අ) ප්‍රකාරව ලංසුව අසාර්ථක වීම සඳහා විශේෂ අඩුලුහුඬුතා පෙන්නුම් කරමින් අතෘප්තියට පත් ලංසුකරු දැනුවත් කර නොතිබුණි.

(ඌ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාර රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කල යුතු වුවද අවස්ථා හතකදී එකතු වටිනාකම රු. 16,728,528 ක්වූ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) ආයතනයේ 2022 වර්ෂයේ අයවැයගත අලෙවි ආදායම රු.860,000,000ක් වූ අතර අලෙවි විධායක නිලධාරීන් සඳහා රු.886,600,000 ක අලෙවි ඉලක්ක ලබා දී තිබුණි.ඉන් රු.323,094,325ක් පමණක් වර්ෂය තුළදී ළඟාකරගෙන තිබුණු අතර අයවැයගත අලෙවි ආදායම සහ සත්‍ය ආදායම අතර රු.536,905,675ක විචලනයක් නිරීක්ෂණය විය. එසේම අලෙවි විධායක නිලධාරීන් වෙත සපයන ලද අලෙවි ඉලක්ක වලින් 64% ක් සපුරා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ආයතනය විසින් ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් අංක 224, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 දරන ස්ථානයේ පිහිටි ගොඩනැඟිල්ලේ පහළ මාලය අංක 4660 දරන බදු ගිවිසුම මඟින් 2014 ජනවාරි 15 දින සිට 2019 ජනවාරි 14 දින දක්වා වසර 05ක කාලයකට බදු පදනම යටතේ ලබාගෙන තිබූ අතර එම බදු කාලය අවසන් වීමෙන් පසුවද 2022 මාර්තු මාසය දක්වා වසර තුනකට වැඩි කාලයක් එම පරිශ්‍රයේ රැඳී සිට තිබුණි. එසේ වුවද නැවත විධිමත් පරිදි ගිවිසුමකට එළැඹීමට කටයුතු කර නොතිබුණු අතර මෙසේ ගිවිසුමකට නොඑළඹී රැඳී සිටි කාලය වෙනුවෙන් ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් සැලසිනේ රූපවාහිනී ආයතනයේ සභාපති වෙත යොමුකරන ලද 2022 මැයි 25 දිනැති අංක NFC/103/04/01 දරන ලිපිය ප්‍රකාරව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාසික ගොඩනැඟිලි කුලී තක්සේරු වාර්තාව අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 12,111,000 ක් බවට දන්වා තිබුණි. එසේ වුවද ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල ගෙවියයුතු හිඟ මුදල

ලෙස පැරණි ගිවිසුම ප්‍රකාරව රු.4,725,000ක් පමණක් හඳුනාගෙන තිබුණු අතර මෙම ගැටළුව විසඳාගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා අනුමත බඳවාගැනීම් පරිපාටියක් නොපැවති අතර 2022 වර්ෂයේදී ද එය අනුමත කරවාගෙන නොතිබුණි. ඒ අනුව බඳවාගැනීම් හා උසස්කිරීම් විධිමත් පරිදි සිදු වන්නේද යන්න විගණනයේදී ගැටලුසහගත විය.

(ඈ) ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 3.3 වගන්තිය ප්‍රකාරව අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවක් ස්ථිර පදනම මත පුරවන තෙක් ඒ සඳහා අනියම් පදනම මත නිලධාරීන් බඳවා ගැනීමෙන් වැළකියයුතු අතර හදිසි අවශ්‍යතාවය මත එසේ සිදුකළත් ඒ සඳහා ස්ථිර නිලධාරියෙකු වහාම පත් කිරීමට කටයුතු කළයුතුය. එසේ වුවද ආයතනයේ අනුමත ස්ථිර කාර්යමණ්ඩලය තුළ ඇතුළත්ව ඇති තනතුරු 08ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 11 දෙනෙකු සේවයේ නියුක්ත කොට තිබුණු අතර සාමාන්‍යාධිකාරී, කළමනාකරු(මූල්‍ය), කළමනාකරු(මානව සම්පත් හා පරිපාලන), අභ්‍යන්තර විගණන නිලධාරී වැනි තනතුරුද ඒ තුළ ඇතුළත් විය. ඒ අනුව අනුමත ස්ථිර කාර්යමණ්ඩලයේ තනතුරු පුරප්පාඩු 25ක් පැවතුණි. අනුමත කොන්ත්‍රාත් කාර්යමණ්ඩලය තුළ ඇතුළත් තනතුරු 02ක් සඳහා ස්ථිර නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර අනුමත කාර්යමණ්ඩලය තුල ඇතුළත් නොවූ තනතුරු 19ක් සඳහා ස්ථිර පදනම්න් 06ක්ද කොන්ත්‍රාත් පදනම්න් 15ක්ද නිලධාරීන් සේවයේ යොදවා තිබුණි.

(ඉ) ආයතනයේ කළමනාකරු (මාධ්‍ය) තනතුරේ 2013 මැයි 02 දින සිට සේවය කරන නිලධාරියා හට 2021 වර්ෂයට අදාළ වැටුප් වර්ධකයට අතිරේකව නිසි පදනමකින් තොරව එකවර වැටුප් වර්ධක 05ක් 2021 අගෝස්තු මස සිට මූලික වැටුපට එක්කොට ලබා දී තිබුණි. කෙසේ වෙතත් එලෙස නිසි පදනමකින් තොරව වැටුප් වර්ධක ගෙවීමට තීරණය කිරීම හේතුවෙන් 2026 වර්ෂය දක්වා නැවත වැටුප් වර්ධක නොගෙවන බව සාමාන්‍යාධිකාරීගේ 2022 දෙසැම්බර් 30 දිනැති ලිපිය මඟින් දන්වා තිබුණි. මෙසේ නිසි පදනමකින් තොරව වැටුප් වර්ධක ගෙවීම හේතුවෙන් මෙම නිලධාරියා හට 2021 හා 2022 වර්ෂයන්හිදී රු.112,750ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිපල පිළිබඳව සැලකීමේ දී ආයතනය 2018 වර්ෂයේ දී රු. 29,704,437 ක ලාභයක් ලබා තිබුණු අතර 2019 වර්ෂය වන විට එම ලාභය රු. 8,300,209 ක් දක්වා අඩු වී තිබුණි.ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.29,339,593 ක බදු පසු අලාභයක් වූ අතර එය 2019 වර්ෂයට සාපේක්ෂව සියයට -253ක වෙනස් වීමකි. 2021 වර්ෂයේ බදු පසු අලාභය රු.6,841,002 ක් වූ අතර

2020 වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.22,498,591 ක වර්ධනයක් නිරීක්ෂණය විය.තවද සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය රු.14,695,458 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.7,854,456 කින් එනම් සියයට 115 කින් මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.39ක් හා 1.38ක් වූ අතර පෙර වසරේදී එම අනුපාත 1.28ක් විය.ඒ අනුව එම අනුපාතයන්ගේ සුළු යහපත් විචලනයක් පෙන්නුම් කළද උපචිතව පැවති ජාතිය ගොඩනැඟීමේ බදු ශේෂය සමාලෝචිත වර්ෂයේදී කපාහැරීම හේතුවෙන් ජංගම වගකීම් පහළ යාම ඊට එක් හේතුවක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාත පිළිවෙළින් සියයට 24 ක් හා සියයට සෘණ 4.55 ක් වූ අතර පෙර වර්ෂයේදී එම අනුපාත පිළිවෙළින් සියයට 26ක් හා සියයට සෘණ 1.47ක් විය.පෙර වසරට සාපේක්ෂව වියදම් අඩු වී තිබුණද ඊට වැඩි ප්‍රතිශතයකින් ආදායම අඩුවී තිබීම ඊට හේතු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති



සැලසීනෙ ටෙලිවිෂන් SELACINE
SELACINE TELEVISION INSTITUTE

No. 380/57, Sarana Road, Colombo 07, Sri Lanka.
Telephone : +94-11- 4320777, +94-11-2058227 I Fax : +94-11-2058229 I Email : info@selacine.lk
Website : www.selacine.lk